**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 02 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2. තත්ත්වාගණනය නොකළ මතය
------------------------------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම
--------------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ ආදායම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් එකතුව රු.6,396,503 ක් වන නමුත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.5,806,085 ක් ලෙස දක්වා තිබුණි. | එක් එක් වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. හදුනාගත නොහැකි අවස්ථා වලදී තක්සේරු කර ගිණුම් ගත කර තක්සේරුව හෙළිදරව් කල යුතුවේ. | පිළිගනිමි<br>ඉදිරි වර්ෂ වලදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් තොරතුරු ලබාගෙන වර්ෂයට අදාලව නිවැරදි තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.374,362 වූ හිඟ කසල බදු ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂය රු.462,012 ක් | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළයුතු වේ. | පිළිගනිමි<br>2017.12.31 දිනට කසල බදු ලේඛනයේ ආයතන කිහිපයක හිග කසල බදු ශේෂ ඉදිරියට ගෙන |

| | |
|---|---|
| ලෙසට ගෙන තිබුණු බැවින් රු.87,650 ක වෙනසක් විය. | නොඒම හේතුවෙන් රු.87,650.00 ක වෙනස නිරූපනය විය. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. 108,031,668 ක් වූ ගිණුම් විෂයකට අදාලව හිමිකම් සහතික ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී එය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මෝටර් ප්‍රවාහන පනත 203 අධිකාරිය 2(1) වගන්තිය | ගල් රෝලක් සහ ට්‍රැක්ටර් ට්‍රේලරයක් ලියාපදිංචි නොකරමින් ධාවනයේ යොදවා තිබුණි. | පනතට අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි ගල්රෝල සහ ට්‍රැක්ටර් ට්‍රේලරය මෙම වර්ෂය තුල ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි ඉන්ධන පරීක්ෂාවන් මෙම වර්ෂයේ සිට සිදු කරමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වේ. | මෙම වර්ෂයේ සිට පරිගණක උපාංග පිළිබදව වෙනමම ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරමි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,544,143 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,119,587 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,307,700 | 1,582,937 | 1,241,763 | 803,187 | 1,450,800 | 1,333,457 | 1,137,300 | 374,362 |
| කුලී | 982,680 | 1,269,600 | 1,201,930 | 147,100 | 1,654,680 | 1,647,180 | 914,740 | 79,430 |
| බලපත්‍ර ගාස්තු | 2,550,790 | 2,840,825 | 2,533,483 | 376,545 | 2,390,555 | 2,454,445 | 2,339,812 | 69,202 |
| වෙනත් ආදායම් | 5,585,936 | 9,706,963 | 11,786,029 | 7,845,664 | 4,330,000 | 8,465,690 | 8,506,038 | 5,756,681 |
| | 10,427,106 | 15,400,325 | 16,763,205 | 9,172,496 | 9,826,035 | 13,900,772 | 12,897,890 | 6,279,675 |

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.6,279,675 ක්ව තිබුණු මුළු හිඟ ආදායම දෙසැම්බර් 31 දින වන විට රු.9,172,496 ක්ව පැවතුණි. | හිඟ ආදායම් රැස්කිරීමට පියවර ගත යුතු වේ. | පිළිගනිමි<br>2019.05.31 දිනට හිඟ කසල බදු රු.133,400 හිඟ කඩ කුලී රු.60,360 හිඟ මුද්දර ගාස්තු රු.2,409,100 ක් හා හිඟ උසාවි දඩ රු.2,361,733 අයවී ඇති බව සඳහන් කරමි. |

2.2.3 වරිපනම් හා බදු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත්කර වරිපනම් බදු පැනවීම සිදුකර නොතිබුණි. | දියුණු කල ප්‍රදේශ ගැසට් කර පනතට අනුව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි<br>දියුණුකළ ප්‍රදේශ හදුනාගෙන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කොට වරිපනම් බදු අයකිරීමට අදාල කටයුතු සිදුකරන බව දන්වමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට මාස 01සිට මාස 86 දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ස්ථාන 375කින් රු.803,187 ක කසල බදු ආදායම් ලැබිය යුතුව තිබුණි. | හිග බදු ආදායම් රැස්කර ගැනීම සඳහා කටයුතු කල යුතු වේ. | පිළිගනිමි<br>හිග කසල බදු ආදායමින් රු.133,400.00 ක මුදලක් 2019.05.31 දිනට අයකරගෙන ඇති අතර හිග මුදල් අයකර ගැනීමට මේ වනවිට ලිඛිතව අදාල පුද්ගලයන් දැනුවත් කර ඇත. |

2.2.4 වෙනත් ආදායම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.4,175,464 ක් හා මුද්දර ගාස්තු රු.3,670,200 ක් විය. | අදාල ආදයම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි<br>අදාල හිග උසාවි දඩ මුදලින් රු.2,361,733.01 ක මුදලක්ද, හිග මුද්දර ගාස්තු වලින් රු.2,409,100.00 ක මුදලක්ද අය වී ඇති අතර ඉතිරි මුදල්ද මෙම වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 07ක් වෙනුවෙන් රු.16,618,915 ක මුදලක් ලැබිය යුතුව තිබුණි. | අදාල ව්‍යාපෘති නිමවී ඇත්නම් මුදල් කඩිනමින් අයකර ගැනීම කල යුතු වේ. | පිළිගනිමි<br>ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 16 ක් සඳහා 2018.12.31 දිනට ප්‍රාදේශීය සභාව වෙත මුදල් ලැබී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ). | සභාව ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 30ක් වෙනුවෙන් රු.14,855,432 ක් ගෙවිය යුතුව තිබුණි. | ව්‍යාපෘතිය සාර්ථකව නිමවී ඇත්නම් සහ වගකීම් කාලය අවසන් වූ පසු ගෙවිය යුතු මුදල් නිරවුල් කල යුතුවේ. | පිළිගනිමි. කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම සඳහා 2018.12.31 දින වන විටත් මුදල් ලැබී නොතිබුණ බව දන්වමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කල යුතු වේ. | අතුරු ව්‍යවස්ථා පැනවීම සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැළැස්මක් පිළියෙළ කලයුතු වේ. | ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව සකස් කොට ඉදිරිපත් කරමි. |

3.2 වත්කම් කළමනාකරණය

----------------------------

3.2.1 වත්කම් ලේඛනගත නොකිරීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.253,600 ක් වූ යන්ත්‍රෝපකරණ අයිතම 06 ක් | වත්කම් ලේඛනගත කලයුතු වේ. | අදාළ වත්කම් නිවැරදිව ස්ථාවර වත්කම් ලේඛන වල සටහන් කර |

| | | |
|---|---|---|
| යන්ත්‍රෝපකරණ ලේඛන වල සටහන් වී නොතිබුණි | | ස්ථාවර වත්කම් ලේඛන නිවැරදිව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

### 3.2.2 නිශ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,245,520 ක්වූ වාහන, යන්ත්‍ර සහ උපකරණ වර්ෂ කිහිපයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | වත්කම් පිළිබඳ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර භාවිතයට ගැනීමට හෝ අපහරණය සඳහා අවශ්‍ය කටයුතු සිදුකල යුතු වේ. | අදාළ වත්කම් නිශ්ක්‍රිය වත්කම් බැවින් ඉදිරියේදී පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන අපහරණ මණ්ඩලයක් මගින් අපහරණ කටයුතු සිදුකිරීමට කටයුතු කරමි. |

## 04 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව සභාවේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමණාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | මෙම වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරමි. |